**විශේෂ සටහන 4**

## ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආර්ථික උත්තේජකයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සහ අභියෝග

### හැඳින්වීම

ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ලොව වටා බොහෝ රටවල නිමැවුමෙන් අති විශාල කොටසකට දායක වෙමින්, සුවිශේෂ රැකියා ප්‍රභවයක් සපයන අතර ව්‍යාපාර අංශයේ මූලය ලෙස පැවතෙමින් ව්‍යවසායයන්ගෙන් අති බහුතරය ලෙස රැඳී පවතියි. බොහෝ රටවල සේවා නියුක්තියෙන් තුනෙන් දෙකක් පමණ එම ව්‍යාපාරවලින් සැපයෙන අතර, ද.දේ.නි.යෙන් සියයට 50කට වැඩි ප්‍රමාණයකට දායකත්වය ලබා දෙයි.[1] විශේෂයෙන්ම, සංවර්ධනය වෙමින් පවතින රටවල වර්ධනයට ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ලබා දෙන දායකත්වයේ වැදගත්කම ඉස්මතු කරමින්, මැදි සහ අඩු ආදායම් රටවලට වඩා ඉහළ ආදායම් උපයන රටවල ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය විසින් ආර්ථික නිමැවුමට දක්වනු ලබන දායකත්වය සාමාන්‍යයෙන් වඩා ඉහළ අගයක් ගනී (Gonzales, Hommes and Laura, 2014).

සාමාන්‍යයෙන්, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ග්‍රාමීය සහ අඩු ආදායම් ප්‍රදේශ ඇතුළුව, සියලු

**රූප සටහන වි.ස. 4.1**
**ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ විශාල ව්‍යාපාරවල මධ්‍යස්ථ ප්‍රතිශත (සියයට)**




මූලය: කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර මූල්‍ය සංසදයෙහි (https://www.smefinanceforum.org) 2019 ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආර්ථික දර්ශක දත්ත ගබඩාවෙන් ලබා ගත් නව දත්ත සමඟ,[1] IFC (Gonzales, Hommes and Laura, 2014) හි ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දේශ දර්ශකවලින් අනුගත කර ගන්නා ලදී.

ස්වරූපයේ සමාජ සමූහයන් පුරා විහිදී පවතින අතර, එවැනි ව්‍යාපාරවල විශාල කොටසක් අවිධිමත් ආයතන වේ. නැගී එන ආර්ථිකයන් තුළ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර මිලියන 365-445ත් අතර ප්‍රමාණයක් පවතින බවටත්, එවැනි ව්‍යාපාරවලින් හතරෙන් තුනකට අධික කොටසක් අවිධිමත් ව්‍යාපාර වන බවටත් වාර්තා වී තිබේ (International Labour Organization, 2016). ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අඩු ආදායම්ලාභී පවුල්වල ආදායම් මට්ටම් ඉහළ නැංවීම සඳහා බෙහෙවින් දායකත්වය සපයනු ලබන බවට පෙනී යන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ආදායම් ව්‍යාප්තියෙහි අසමානතා අවම කිරීමට දායක වේ. තවද, ප්‍රමාණයෙන් කුඩා වීම සහ පාරිභෝගික කේන්ද්‍රීය ව්‍යාපාර ආකෘතිවල ප්‍රතිඵලයක් ලෙස, කුඩා ව්‍යාපාර වඩා නම්‍යශීලී වන අතර, වෙනස් වන පරිසරයට සහ තාක්ෂණයේ සිදු වන නව වැඩි දියුණු වීම් වලට අනුවර්තනය වීම මගින් ආර්ථික හැළහැප්පීම්වලට වඩා හොඳින් ඔරොත්තු දීමේ හැකියාවක් ද එම ව්‍යාපාර වලට ඇත. එබැවින්, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට යම් තාක් ප්‍රමාණයකට ආර්ථිකයක ඔරොත්තු දීමේ ශක්තිය වැඩි දියුණු කළ හැකි අතර, වර්ධනය සහ සංවර්ධනය සඳහා මඟ පාදයි.

### වර්ධන උත්තේජනයක් ලෙස ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර

ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල පැවැත්ම සහ රටක සමස්ත ආර්ථික වර්ධනය අතර ධනාත්මක සබඳතාවක් ඇති බව සනාථ කිරීමට ලේඛන සැලකිය යුතු ප්‍රමාණයක් සංඛ්‍යානමය සාක්ෂි සපයයි. සාමාන්‍යයෙන්, සාර්ථක ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර විශාල ආයතන බවට ක්‍රමයෙන් විකාශය වන අතර, එවැනි ආයතන ආර්ථික වර්ධනයට අතිවිශාල දායකත්වයක් සපයනු ලැබේ. ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සමාජයේ සෑම කොටසකටම ප්‍රතිලාභ ලැබෙන පරිදි වූ සහ තුලිත වර්ධනයකට මඟපාදමින්, විශාල ව්‍යාපාරවලට පදනම සපයන මාධ්‍යයක් ලෙස, රැකියා සපයන්නෙකු සහ නවෝත්පාදනයට පහසුකම් සලසන්නෙකු ලෙස ආර්ථිකයට වැදගත් දායකත්වයක් ලබා දෙයි.

**ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර විශාල ව්‍යාපාර සඳහා පදනම සපයන මාධ්‍යයකි:** වඩාත් සාර්ථක ආර්ථිකයන් විශාල සහ කුඩා ව්‍යාපාර යන දෙවර්ගයෙහිම හිතකර සංයෝජනයකින් සමන්විතය. විශාල ව්‍යාපාර සාමාන්‍යයෙන් වඩා ඵලදායී වන අතර, ප්‍රාග්ධන මූලික ව්‍යාපෘති තුළ ආයෝජනය කිරීමට අවශ්‍ය ධාරිතාව ඒවා සතු වේ. තවද එවැනි ව්‍යාපාර විශාල පරිමාණයෙන් පර්යේෂණ සහ සංවර්ධන කටයුතුවලට පහසුකම් සලසන

1 රටවල් 176ක ලියාපදිංචි කරන ලද ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ විශාල ව්‍යාපාරවල ද්විතියික දත්තවලින් සමන්විත වන, කුඩා හා මධ්‍ය පරිමාණ මූල්‍ය සංසදයෙන් (https://www.smefinanceforum.org) ලබා ගත හැකි 2019 ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආර්ථික දර්ශක දත්ත ගබඩාවෙහි දත්ත මත පදනම්ව ඇත. පවතින නවතම වසර සඳහා තොරතුරු සලකා බලනු ලැබූ අතර, එය සියලු රටවල් සඳහා අවශ්‍යයෙන් සමාන නොවිය හැකිය. මූලාශ්‍ර ආයතන සහ කාල පරාසයන්හි පවතින වෙනස්කම් හේතුවෙන් දත්ත ප්‍රමිතිගත කර නොමැති බැවින්, රටවල් සංසන්දනය කිරීම යම් ප්‍රමාණයකට සීමා වේ. පවත්නා දත්ත මත පදනම්ව, මධ්‍යස්ථ අගයන් කරා එළඹීමට භාවිත කළ රටවල් ගණන සේවා නියුක්ති ප්‍රතිශතය සඳහා 80ක් වන අතර, එකතු කළ අගයේ ප්‍රතිශතය සඳහා 38ක් වේ.

2

අතර, වර්ධන පරිච්ඡේදයන්ට දායකත්වය ලබා දෙන නව දැනුම බිහි කිරීමට පෙරළා පහසුකම් සලසනු ලබයි. අනෙක් පසින්, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර එවැනි විශාල ආයතන සඳහා පදනම සපයන මාධ්‍යයක් ලෙස ක්‍රියා කිරීම මගින් වැදගත් කාර්යභාරයක් ඉටු කරන අතර, එවැනි විශාල ආයතන හරහා පෙරළා සැපයුම් දාම ප්‍රසාරණය වීම ඔස්සේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ව්‍යාපාර කටයුතු ප්‍රවර්ධනය කෙරෙනු ඇත. සැම්සන්ග්, ඇපල්, මයික්‍රොසොෆ්ට්, ෆේස්බුක් වැනි නූතන ගෝලීය ව්‍යාපාරික දැවැන්තයන් බොහෝ දෙනෙකු කුඩා ව්‍යාපාර ලෙස ඔවුන්ගේ කටයුතු ආරම්භ කර ඇති අතර, එමගින් අවසානයේ දී අදාළ ජාතික සහ කලාපීය ආර්ථිකයන් මෙහෙයවීම දක්වා, ඕනෑම පරිමාණයකට විකාශය වීම සඳහා එවැනි කුඩා ව්‍යාපාර සතු හැකියාව ඉස්මතු කෙරෙයි. සත්‍ය වශයෙන් ම, සාර්ථක ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයකට, පෙරළා මානව ප්‍රාග්ධනය වර්ධනය කරමින්, රටක සාමාන්‍ය ජනතාව අතර ව්‍යවසායකත්ව නිපුණතා වැඩි දියුණු කිරීමට දායක විය හැකි අතර, එය තිරසාර වර්ධනයක් සඳහා පූර්ව අවශ්‍යතාවයක් වේ.

**ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආර්ථිකයක සේවා නියුක්තිය සහ සමස්ත නිමැවුම ඉහළ නංවයි:** සැලකිය යුතු ලෙස විශාල ව්‍යාපාර සංඛ්‍යාවකින් සමන්විත, විශාලතම අංශය වන, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, ජනගහණයේ විශාල කොටසකට රැකියා අවස්ථා සපයයි. මහජනයාගේ ගෙවීමේ ශක්තිය වැඩි කිරීමට මින් පෙරළා සහාය හිමි වන අතර, එමගින් පරිභෝජනය ඉහළ නැංවීම සහ සමස්ත ආර්ථික වර්ධනය වැඩි දියුණු කිරීම සිදු කෙරේ. ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආර්ථිකයේ අංශ බහුතරයක් පුරා විහිදී යැමත් සමඟ, ජීවනෝපාය ප්‍රකාරව පුද්ගලයන් විශාල ගණනක් සවිබල ගැන්වීම සහ අසමානතාවය අවම කිරීමට දායක වීම මගින්, තිරසාර සංවර්ධන ඉලක්ක අත්පත් කර ගැනීමෙහිලා මෙම ආයතන විසින් වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබන අතර, එමගින් ස්ථාවර වර්ධන වේගයන් පවත්වා ගැනීම සඳහා අදාළ ආර්ථිකයන්ට සහාය ලබා දෙනු ලැබේ. තවද, තිරසාර සංවර්ධන ඉලක්ක අත්පත් කිරීම මගින් සාමාන්‍යයෙන් රටවල් මත ධනාත්මක ප්‍රතිරූපයක් ඇති වීම හේතුවෙන්, ආයෝජක විශ්වාසය වැඩි දියුණු කිරීම හරහා ආර්ථිකයන්ට සහාය ලබා දීම සඳහා සාර්ථක ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ අංශයකට වක්‍ර භූමිකාවක් ද ඉටු කළ හැකිය.

**ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර මගින් ව්‍යාපාර අතර තරඟකාරීත්වය ඉහළ නංවයි:** සුවිශේෂී ව්‍යාපාර අවස්ථා හඳුනා ගැනීම මගින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට ඒවායෙහි අදාළ ව්‍යාපාර පරිසරයන් තුළ තරඟකාරීත්වය ඉහළ නැංවිය හැකිය. හිතකර පරිසරයක් යටතේ, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර විසින් නිර්මාණය කරනු ලබන ඉහළ තරඟකාරී මට්ටම මගින් තිරසාර වර්ධන මාර්ගවල අත්‍යවශ්‍ය අංගයක් වන නවෝත්පාදන අදහස් දිරිමත් කළ හැකිය. ගමන්වාර බෙදා ගැනීම සඳහා Uber සහ Lyft ද ගෘහස්ත නවාතැන් පහසුකම් සඳහා Airbnb ද වැනි නව්‍ය සාර්ථක අදහස් ඉදිරිපත් කොට මෑත කාලයේ දී සාර්ථකත්වයට පත් වූ ව්‍යාපාර සහ තවත් එවැනි අනුවර්තන සිදු කළ ව්‍යාපාර බොහොමයක්, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල නවෝත්පාදන ධාරිතාව මෙන්ම, සාමාන්‍යයෙන් සාම්ප්‍රදායික විශාල ආයතනවල කොටසක් නොවන පාර්ශ්වයන් ගණනාවකගේ ජීවිත එම ව්‍යාපාරවලට සමෘද්ධිමත් කළ හැකි වන්නේ කෙසේද යන්නටත් සාක්ෂි සපයයි.

**සංවර්ධනය වෙමින් පවතින සහ නැගී එන ආර්ථිකයන් තුළ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල වැදගත්කම**

තිරසාර සංවර්ධනය සහ නවෝත්පාදනය සඳහා පහසුකම් සැලසීම මගින් දරිද්‍රතාවය මැඩපැවැත්වීම මත සඵලදායී කාර්යභාරයක් සිදු කිරීම හේතුවෙන්, නැගී එන සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි සංවර්ධන ක්‍රියාවලියට ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල දායකත්වය විශේෂයෙන් ම වැදගත් වේ. ජනගහන වර්ධනය හේතුවෙන්, 2030 වර්ෂය වන විට මිලියන 600ක පමණ රැකියා අවශ්‍ය වනු ඇතැයි ලෝක බැංකුව මගින් ඇස්තමේන්තු කර ඇත. සංවර්ධනය වෙමින් පවතින රටවල සාමාන්‍යයෙන් දක්නට ලැබෙන ඉහළ ජනගහන වර්ධනයන් සලකා බැලීමේ දී, රැකියා සපයන්නෙකු ලෙස ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල කාර්යභාරය අතිශය වැදගත් වේ. ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සාමාන්‍යයෙන් වඩාත් ශ්‍රම මූලික ව්‍යාපාර වීම හරහා සංවර්ධනය වෙමින් පවතින සහ නැගී එන රටවල විශාල ශ්‍රම බලකායන් අවශෝෂණය කර ගැනීමේ හැකියාව එම ව්‍යාපාර සතු බැවින්, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර රැකියා සපයන්නෙකු ලෙස විශාල ව්‍යාපාරවලට වඩා වැදගත් වේ. තවද, සංවර්ධනය වෙමින් පවතින රටවලට කාන්තා ශ්‍රම බලකා සහභාගීත්වය වැඩි දියුණු කිරීම, ඌණ භාවිත ස්වභාවික සම්පත් සඵලදායීව භාවිතා කිරීම සහ විවිධ අංශ හරහා ආර්ථික කටයුතු විවිධාංගීකරණය වැනි ගැටලු සඳහා පිළියම් යෙදීමට ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර භාවිත කළ හැකිය. ඒ සමගම, හිතකර තත්ත්වයන් යටතේ, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල නවෝත්පාදන ධාරිතාව, සංවර්ධනය වෙමින් පවතින සහ නැගී එන ආර්ථිකයන්ට ඉහළ ආදායම් රටවල් දක්වා උසස් වීමේ හැකියාව ලබා දෙමින්, එම රටවලට ඉහළ වර්ධන මට්ටම් පවත්වා ගැනීම සඳහා සහාය විය හැකිය. ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල නවෝත්පාදන කටයුතු සඳහා පහසුකම් සැලසීමට ප්‍රතිපත්තිමය සහායයේ පවතින වැදගත්කම ඉස්මතු කරමින්, කොරියාව, මැලේසියාව, ඉන්දුනීසියාව, තායිලන්තය, ඉන්දියාව වැනි ආසියානු ආර්ථිකයන්හි වර්ධන අවකාශයන් නවෝත්පාදක කුඩා ව්‍යාපාර විසින් මෙහෙයවනු ලබන බව දක්නට ලැබේ (Asian Productivity Organization, 2015).

2

**ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර විසින් මුහුණ දෙනු ලබන අභියෝග**

ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ඇතැම් ලක්ෂණ, නිදසුනක් ලෙස, ඒවායේ කුඩා ප්‍රමාණය, යම් අංශයන්හි දී ප්‍රතිලාභදායක විය හැකි වුවත්, පහත සාකච්ඡා වන ආකාරයේ සැලකිය යුතු අභියෝගවලට මඟපාදමින්, විශාල ව්‍යාපාර සමඟ සැසඳීමේ දී, අවසාන වශයෙන් අඩු ඵලදායීතාවක් සඳහා හේතු වෙමින්, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ස්වභාවය ඇතැම් විට ගැටලුවක් බවට පත් විය හැකිය.

**සීමිත මූල්‍ය ප්‍රවේශය:** මූල්‍ය පහසුකම් ලබා ගැනීමේදී ඇති දුෂ්කරතා බොහෝ රටවල ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර විසින් මුහුණ දෙනු ලබන ප්‍රධාන බාධකවලින් එකක් වේ. අධ්‍යයන මගින් තහවුරු කර ඇති පරිදි, මූල්‍යනය වෙත ඇති එවැනි සීමිත ප්‍රවේශය ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල වර්ධනයට ඇති ප්‍රධානම බාධාව ලෙස පවතියි. එහි ප්‍රතිඵලයක් ලෙස, මෙවැනි ව්‍යාපාර බොහොමයකට ප්‍රාග්ධන මූලික ව්‍යාපෘති සිදු කිරීම දුෂ්කර වේ. මින් පෙර සිදු කර ඇති අධ්‍යයන මගින් ඉස්මතු කර ඇති පරිදි, විධිමත් මූල්‍ය ආයතනවලින් සේවා ලබා ගැනීමේ දී ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර මුහුණ දෙන දුෂ්කරතාවලට මුල් වන හේතු අතර, තොරතුරු අසමමිතිය, සීමිත ඇපකර ප්‍රමාණය සහ ඇපකරවල අඩු ගුණාත්මකභාවය, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල අඩු මූල්‍ය සාක්ෂරතාව, ඉහළ ණය පැහැර හැරීම් ප්‍රතිශත සහ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ඇගැයීමේ දී ණය දෙන්නන්ගේ ප්‍රවීණතාව සීමිත වීම ආදිය ඇතුළත් වේ. මෙම සීමාවන්හි ප්‍රතිඵලයක් ලෙස, විශේෂයෙන් ම ව්‍යාපෘති මූල්‍යනය සඳහා, බැංකු මගින් ඇපකරයක් රහිතව මූල්‍ය පහසුකම් ලබා ගැනීම අතිශයින්ම අසීරු කාර්යයක් වේ.

**සීමිත ව්‍යාපාර කුසලතා සහ මානව සම්පත් රඳවා ගැනීමට නොහැකි වීම:** ඕනෑම ව්‍යාපාරයක සාර්ථකත්වය සඳහා අත්‍යවශ්‍ය අංග වන මූල්‍ය පාලනය, ගිණුම්කරණය, බදු කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය සහ අලෙවිකරණය වැනි ක්ෂේත්‍රවල ප්‍රවීණතාව අඩු වීම ද ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ප්‍රධාන ගැටලුවක් ලෙස පවතියි. තවද, ස්වභාවයෙන්ම, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට විශාල අලාභ දරා ගැනීමේ හැකියාව අඩු වන අතර, ඒ හේතුවෙන් ව්‍යාපාර චක්‍ර සහ දේශීය සහ ජාත්‍යන්තර පාර්ශ්ව වලින් හට ගන්නා කම්පන මගින් ඉහළ අවදානමට ලක් වීමේ හැකියාවක් මෙම ව්‍යාපාර වලට ඇත. ප්‍රධාන සේවකයන් රඳවා ගැනීමට නොහැකි වීම ද ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ප්‍රගතියට බාධා ගෙන දෙන කාරණයක් ලෙස හඳුනාගෙන ඇත. බොහෝ අවස්ථාවල දී, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර විසින් සපයනු ලබන රැකියා අවස්ථා තාවකාලික රැකියා වීමේ ප්‍රවණතාවක් පවතින අතර, ඒ හේතුවෙන් සේවකයන්ට නිරන්තරයෙන් වෙනත් රැකියා අවස්ථා සොයා යෑමට සිදු වේ. එමෙන්ම, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට, විශේෂයෙන්ම පුහුණු ශ්‍රමිකයන් සඳහා, විශාල ආයතන විසින් පිරිනමනු ලබන වැටුප් සහ ප්‍රතිලාභ සමඟ බොහෝ විට තරඟ වැදිය නොහැකි අතර, ඒ හේතුවෙන් සේවක හැර යාම් ඉහළ යාම සහ කුඩා ව්‍යාපාර දියුණු කිරීමේ හැකියාව ඇති එවැනි පුහුණු ශ්‍රමිකයන් රඳවා ගැනීමට නොහැකි වීමත් සිදු වේ. එහි ප්‍රතිඵලයක් ලෙස, කුඩා ව්‍යාපාර බොහොමයක් ඒවායෙහි හිමිකරුවන් විසින් ම කළමනාකරණය සහ පවත්වාගෙන යනු ලැබීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරන අතර, ඉන් පෙරළා සාර්ථක ව්‍යාපාරවලට පවා, කළමනාකරණය, පාලනය, මූල්‍ය සහ තිරසාර බව පිළිබඳ ගැටලු පැන නැගෙයි.

**නියාමන බාධක සහ එකිනෙක නොගැළපෙන ප්‍රතිපත්ති:** ව්‍යාපාර ලියාපදිංචිය, ගුණාත්මකභාවය සහ පාරිසරික ප්‍රමිති, වාර්තාකරණ අවශ්‍යතා, බදුකරණය වැනි විවිධ පැතිකඩ ඔස්සේ නොයෙක් රටවල තිබෙන නියාමන බාධා හේතුවෙන් ද ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දුෂ්කරතාවලට මුහුණ දෙයි. කෙසේ වෙතත්, මෙම දුෂ්කරතා සහ ඒවායෙහි බලපෑම විවිධ රටවල් අතර සැලකිය යුතු ලෙස වෙනස් විය හැකිය. නිදසුනක් ලෙස, පසු ගිය දශක කිහිපය මුළුල්ලේ ආර්ථික සහයෝගීතාව සඳහා වන රටවල (OECD) නියාමන බාධකවල විශාල අඩු වීමක් දක්නට ලැබුණ ද, එවැනි බාධකවල සංකීර්ණත්වය රටකින් රටකට වෙනස් වේ (OECD, 2018). සාමාන්‍යයෙන්, කුඩා ව්‍යාපාරවලට නිපුණතා සහ අරමුදල් සපයා ගැනීමේ අපහසුතා හේතුවෙන් නියාමන සංකීර්ණතා සාර්ථකව අධ්‍යයනය කිරීමේ ධාරිතාවක් නොමැත. එහි ප්‍රතිඵලයක් ලෙස, ව්‍යාපාර පවත්වාගෙන යාමේ පරිසරයේ පවතින සමස්ත සීමා ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ගැටලු රැසකට හේතු විය හැකි අතර, එය සාපේක්ෂව දුර්වල ආයතනික යටිතල පහසුකම් සමඟ ක්‍රියාත්මක වීම හේතුවෙන්, සංවර්ධනය වෙමින් පවතින රටවලට විශේෂයෙන් අදාළ විය හැකිය. තවද, ප්‍රතිපත්ති ගැළපීමේ අඩු බව සහ අඩු විනිවිදභාවය ද ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර විසින් මුහුණ දෙනු ලබන මෙම නියාමන බාධා තීව්‍ර කිරීමට හේතු වේ.

**අඩු වෙළඳපොළ කොටස සහ වෙළඳපොළ වෙත පවතින සීමිත ප්‍රවේශය:** ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආදායම් මට්ටම් පවත්වාගෙන යෑමේදී ද අභියෝගවලට මුහුණ දෙන අතර, අඩු වෙළඳපොළ කොටස සහ වෙළඳපොළ වෙත පවතින දුර්වල ප්‍රවේශය ප්‍රධාන වශයෙන් හේතු කොටගෙන, සාමාන්‍යයෙන් අඩු විකුණුම් ප්‍රමාණවලින් පීඩා විඳියි. විශාල ප්‍රචාරණ අයවැය දරා ගැනීමට නොහැකියාව, සීමිත ව්‍යාපාර සම්බන්ධතා, සීමිත සමාජ මාධ්‍ය භාවිතය සහ සීමිත මාර්ගගත සහභාගීත්වය මෙන්ම,

සංසන්දනාත්මකව අඩු වෙළඳපොළ ප්‍රවේශයක් කරා හේතු වන නව තාක්ෂණයට අනුගත වීමේ දුර්වලතා යනාදී විවිධ හේතූන් මේ සඳහා දායක විය හැකිය.

**ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර පිළිබඳ තොරතුරු සහ දත්තවල හිඟය:** විශේෂයෙන්ම, සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් ඇතුළුව, බොහෝ රටවල ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර පිළිබඳ තොරතුරු ලබා ගැනීම සාමාන්‍යයෙන් අසීරු කාර්යයක් වේ. විශේෂයෙන්ම මූල්‍ය දත්තවලට අදාළව, තොරතුරු ප්‍රසිද්ධ කිරීමේ අවශ්‍යතා පවතින විශාල ආයතන මෙන්, සාමාන්‍යයෙන් එවැනි අවශ්‍යතා නොමැති ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල තොරතුරු එම ව්‍යාපාරවල පෞද්ගලික සන්තකයේ තබා ගැනෙන අතර, විශ්වසනීය තොරතුරු ලබා ගැනීම සඳහා පිරිවැයක් දැරීමට ණය දෙන්නන් හට සිදු වීම හරහා ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට ණය ලබා දීමට ණය දෙන්නන් අධෛර්යමත් වේ (Yoshino and Taghizadeh-Hesary, 2016). එමගින් මෙම ව්‍යාපාර සමීක්ෂණය කිරීම සඳහා මූල්‍ය ආයතන සතු හැකියාව වැළැක්වීම පමණක් නොව, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය පිළිබඳ පර්යේෂණ ප්‍රමාණය, ඒවායේ ගුණාත්මකභාවය සහ කාලීන බව ද සීමා කරන හෙයින්, මෙය ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල සංවර්ධනය සඳහා බාධාවකි.

**වසංගතයේ සහ අනෙකුත් ප්‍රවණතාවන්හි බලපෑම:** කොවිඩ්-19 වසංගතය තුළ දී ලොව පුරා ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දුෂ්කරතා වලට මුහුණ පෑ අතර, එමගින් ආදායම් විශාල වශයෙන් අඩු වීමත් අවිනිශ්චිතතා ඉහළ යාමත් සිදු විය. එම ව්‍යාපාරවලට මෙම අසීරු කාලයට මුහුණ දීම සඳහා රජය සහ අනෙකුත් බලධාරීන් විසින් පෙර නොවූ මට්ටමින් ලබා දුන් ප්‍රතිපත්තිමය සහාය උපකාරී වන්නට ඇති වුවත්, එම ව්‍යාපාර අතරින් බොහොමයක් සම්පූර්ණයෙන් ම යථා තත්ත්වයට පත් වී නොමැත. රුසියානු-යුක්රේන ගැටුම හේතුවෙන් ගෝලීය දේශපාලනික වාතාවරණය තුළ හට ගත් අවිනිශ්චිතතාව මගින් ද, විශේෂයෙන්ම, අගය දාම, අපනයන අංශ සහ සංචාරක ක්ෂේත්‍රය වැනි සේවා වෙළඳාම්වලට සම්බන්ධ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා දුෂ්කරතා එල්ල විය හැකිය.

**ස්ත්‍රී-පුරුෂ භාවය අනුව පවතින අසමානතා:** ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල කාන්තා ව්‍යවසායිකාවන්ගේ සහභාගීත්වය රටවල් අතර වෙනස් වන බවට වාර්තා වී ඇත. විධිමත් කුඩා ව්‍යාපාරවලින් තුනෙන් එකක් පමණ කාන්තාවන් විසින් හිමිකාරීත්වය දරනු ලබන ව්‍යාපාර වන බව අධ්‍යයන මගින් වාර්තා වුව ද, මෙම කොටස නැගෙනහිර ආසියාව සහ පැසිෆික් කලාපයේ සියයට 40කට අධික වැඩිම අගයක සිට දකුණු ආසියාවෙහි සියයට 10කට පහළ අඩුම අගයක් දක්වා පරාසයක පවතී. (IFC, 2014). කුඩා ව්‍යාපාර විසින් මුහුණ දෙනු ලබන පොදු අභියෝගවලට අමතරව, කාන්තාවන් හිමිකාරීත්වය දරන ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංස්කෘතික නැඹුරුතා, ව්‍යාපාර විශාලත්වය සාපේක්ෂව අඩුවීම සහ ව්‍යාපාර සබඳතා අඩු බව මත පදනම්ව, අතිරේක බාධාවන්ට මුහුණ දෙයි. කාන්තාවන් හිමිකාරීත්වය දරන ව්‍යාපාර මත කොවිඩ්-19 වසංගතයේ බලපෑම ද අසමානුපාතික වන අතර, පිරිමි පුද්ගලයන් හිමිකාරීත්වය දරන ව්‍යාපාරවලට වඩා කාන්තාවන් හිමිකාරීත්වය දරන ව්‍යාපාරවලින් විශාල කොටසක් වසංගතයෙන් පීඩාවට පත් වූ අතර, වසා දැමීමේ තත්ත්වයට පත් වීමේ ඉඩකඩක් ඇති බව පෙනී යයි (United Nations, 2021). කෙසේ වෙතත්, බොහෝ විට මූල්‍ය ආයතන විසින් නිසි අවධානයක් යොමු නොකළ ද, කාන්තාවන් හිමිකාරීත්වය දරන ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හොඳින් ක්‍රියාත්මක වන බවට සාක්ෂි ඇත (IFC, 2014). සමාජයේ සෑම කොටසකටම ප්‍රතිලාභ ලැබෙන පරිදි වූ වර්ධනයක් ළඟා කර ගැනීම සඳහා මෙම ස්ත්‍රී-පුරුෂ භාවය අනුව සිදු වන අසමානතාවලට පිළියම් යෙදීම සඳහා දිගින් දිගටම කැපවීමේ වැදගත්කම ඉස්මතු කරමින්, කාන්තාවන් විසින් වඩාත් පවුල් සහ ප්‍රජාවන්හි ප්‍රතිආයෝජන සිදු කරන හෙයින් (International Trade Centre, 2014), කාන්තා ව්‍යවසායිකාවන් සංවර්ධන ඉලක්ක අත්පත් කර ගැනීමෙහිලා වැඩි දායකත්වයක් දක්වයි.

**ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය ප්‍රවර්ධනය කිරීම සඳහා වන සාර්ථක ක්‍රමෝපායන්**

ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර විසින් මුහුණ දෙනු ලබන සුලභ ගැටලු සඳහා පිළියම් යෙදීමට විවිධ රටවල් විසින් ක්‍රමෝපායන් ගණනාවක් භාවිත කර ඇත.

**මූල්‍යන දුෂ්කරතා සඳහා පිළියම් යෙදීම:** නොයෙක් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට විධිමත් අංශ වලින් මූල්‍ය පහසුකම් ලබා ගැනීම දුෂ්කර වන බැවින්, මෙම අවහිරතාව අවම කිරීම සඳහා වන ක්‍රමෝපායන් මගින් බොහෝ විට ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල වර්ධනයට දායක විය හැකිය. තවද, බොහෝ විට, කුඩා ව්‍යාපාර විසින් මුහුණ දෙනු ලබන අනෙකුත් අභියෝග ද, මුදල් සපයා ගැනීමේ දුෂ්කරතා හේතුවෙන් ඇතිවන අඩු ධාරිතාව සමඟ බැඳී ඇත. මේ හා සම්බන්ධව, විවිධ රටවල් විසින් ගන්නා ලද සාර්ථක ක්‍රමෝපායන්ට මූල්‍ය ආයතන විසින් ඇපකර මත පදනම්ව ලබා දෙන ණය පහසුකම් වල ඇති අඩුලුහුඬුකම් සඳහා පිළියම් යොදන ණය ඇප ආවරණ යෝජනා ක්‍රම හඳුන්වා දීම (උදාහරණ ලෙස, ජපානයේ පවත්වාගෙන යන විවිධ ණය ඇප ආවරණ සංස්ථා, කොරියාවේ Korea Credit Guarantee Fund සහ Korea Technology Finance Corporation, මැලේසියාවේ Credit Guarantee Corporation Malaysia Berhad යනාදිය), අඩු හෝ කිසිදු ලාභයක් ඉපයීමේ අරමුණකින් තොරව අධි අවදානම් ව්‍යාපෘති සඳහා ණය ලබා දීමෙහි විශේෂීකරණය වී සිටින සංවර්ධන බැංකු පිහිටුවීම (උදාහරණ ලෙස, චීනයේ China Development Bank, ජර්මනියේ Kreditanstalt für Wiederaufbau (KfW Bankengruppe), කොරියාවේ Korea Development Bank යනාදිය), විධිමත් මූල්‍ය ආයතන විසින් කුඩා ව්‍යාපාර

වෙත ණය ලබා දීම් මෙහෙය වීමට ණය ලබා දීමේ ඉලක්ක පැනවීම වැනි ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම, බහුජාතික නියෝජිත ආයතන ඔස්සේ දායක මූල්‍යනය, සමූහ අරමුදල්කරණය (crowdfunding) හා නව ව්‍යාපාර මත මුදලින් දායක වන ආයෝජකයන් (angel investors) වැනි විකල්ප මූල්‍යන මාර්ග වෙත ප්‍රවේශය වැඩි දියුණු කිරීම, සහ ණය දෙන්නන් හට අවශ්‍ය වන තොරතුරු සමග ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දත්ත පද්ධති සංවර්ධනය කිරීම (උදාහරණයක් ලෙස, කුඩා ව්‍යාපාර විශාල ගණනක මූල්‍ය තොරතුරු සමග ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වෙත ණය සැපයුමේ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම ඉලක්කගත කර ඇති ජපානයේ Credit Risk Database) වැනි තොරතුරු අසමමිතිකතා අවම කර ගැනීම සඳහා වන ක්‍රියාමාර්ග ඇතුළත් වේ.

**ජයග්‍රාහකයන්ට සහාය ලබා දීම:** ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල මූල්‍ය දුෂ්කරතා සම්බන්ධ ගැටලුවලට පිළියම් යෙදීමට අමතරව, මෙම අංශයේ ව්‍යාපාර වෙත සමස්ත සහාය ලබා දීම සඳහා ලොව පුරා අනෙකුත් වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක වේ. නිදසුනක් ලෙස, කොරියාව වැනි ඇතැම් රටවල් ජාතික ප්‍රමුඛතාවලට අනුකූලව වර්ධන හැකියාවක් හා සංවිධානාත්මක ධාරිතාවක් සහිත කර්මාන්ත සහ ව්‍යාපාර වෙත සහාය ලබා දීම ඉලක්ක කෙරුණු, ජයග්‍රාහකයන් තෝරා ගැනීමේ ප්‍රවේශයක් භාවිත කර ඇත. කෙසේ වෙතත්, එවැනි ප්‍රතිපත්තියක් සම්පත් බෙදා හැරීමේ අඩුලුහුඩුකම් සඳහා තුඩු දිය හැකි බැවින්, එවැන්නකට එරෙහි විවේචන ද එල්ල වේ. කෙසේ වෙතත් එය, විශේෂයෙන්ම, වෙළඳපොළ මගින් මෙහෙයවෙන බෙදා හැරීම්වලින් වර්ධන හැකියා ඇති අංශ කරා සම්පත් ළඟා නොවන කාලයන්හි දී, අරමුණු කර ගත් අංශ කරා සම්පත් ගලා යැවීම සඳහා යොදා ගත හැකි ප්‍රතිපත්තියකි.

**සමූහගත කිරීම සහ සම්බන්ධතා වැඩි දියුණු කිරීම:** ගෝලීය වෙළඳපොළ ලිහිල්කරණය සහ ගෝලීයකරණය මගින් ජාත්‍යන්තර තරගකරුවන්ට එරෙහිව හැකියාවන්හි නොගැළපීම් හේතුවෙන් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට අවාසිදායක තත්ත්වයක් ඇති විය හැකිය. මේ හා සම්බන්ධව, මැලේසියාවේ කාර්මික සම්බන්ධතා වැඩසටහන (Industrial Linkage Programme) වැනි ක්‍රියාමාර්ග හරහා ව්‍යාපාර සමූහ බිහි කිරීම හා විශාල සංවිධානවල අගය දාම සමග ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සම්බන්ධ කිරීම මගින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට ජාත්‍යන්තර වෙළඳපොළ තුළ තරග වැදීමට සහාය ලබා දිය හැකිය. තවද, නව තාක්ෂණය, කළමනාකරණ ක්‍රමවේද, වෙළඳපොළ සහ ආදාන අමුද්‍රව්‍ය, සහ නිෂ්පාදන ශිල්පක්‍රම පහසුවෙන් ග්‍රහණය කර ගැනීම හරහා ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට ප්‍රතිලාභ සපයන අතරතුර, විශාල ව්‍යවසායන් සහ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අතර උප කොන්ත්‍රාත් සබඳතා ඇති කර ගැනීම මගින් කර්මාන්තයේ ඵලදායීතාව වැඩි දියුණු කළ හැකිය (Wijesinha, 2011).

**ඉලක්කගත සහාය:** ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ආර්ථික දායකත්වය ඉහළ නැංවීම අරමුණු කර ගත්, තායිලන්තයේ කුඩා හා මධ්‍ය පරිමාණ ප්‍රවර්ධන සැලැස්ම (SME Promotion Plan) වැනි ජාතික ප්‍රමුඛතාකරණ වැඩසටහන් (OECD/ERIA, 2018) මගින් ද රටක ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වෙත සහාය ලබා දීමේ උත්සාහයන් විධිමත් කළ හැකිය. ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර විසින් තොරතුරු තාක්ෂණය අවම ලෙස භාවිත කිරීම වැඩි දියුණු කළ යුතු ප්‍රධාන අංශයක් ලෙස බොහෝ විට සඳහන් වේ. කොවිඩ්-19 වසංගතයේ ප්‍රතිඵලයක් ලෙස, මංගත සහභාගීත්වයක් නොපැවති ව්‍යාපාර පවා ගනුදෙනුකරුවන් සහ සැපයුම්කරුවන් වෙත ළඟා වීම සඳහා මංගත උපකරණ භාවිත කිරීම ඇරඹීය. කෙසේ වෙතත්, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර විසින් තොරතුරු තාක්ෂණ නිෂ්පාදන සහ සේවා තම ව්‍යාපාර කටයුතු සඳහා භාවිත කරනු ලැබීමෙන් බොහෝ ප්‍රතිලාභ ලබා ගැනීමේ හැකියාවක් ඇත. මෙම කරුණ සලකා බැලීමේ දී, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර විසින් තොරතුරු තාක්ෂණය යොදා ගැනීම වැඩි දියුණු කිරීම අරමුණු කර ගත්, ඉන්දියාවේ ඩිජිටල් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර යෝජනා ක්‍රමය (Digital MSME Scheme)[2] වැනි වැඩසටහන් මගින්, රාජ්‍ය සහ වෙනත් සහායක කණ්ඩායම්වලට තොරතුරු තාක්ෂණය භාවිත කිරීමේ ප්‍රතිලාභ පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීම ඔස්සේ ප්‍රධාන කාර්යභාරයක් සිදු කළ හැකිය. මෙම ව්‍යවසායකයන්ගේ ව්‍යාපාර කුසලතා වැඩි දියුණු කිරීමට දායක වීම මගින්, බහුපාර්ශ්වික දායක නියෝජිත ආයතනයන් ද ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ධාරිතා වර්ධනය සඳහා සහාය ලබා දෙයි. තවද, දේශගුණික විපර්යාස සඳහා පිළියම් යෙදීමට ලොව පුරා බොහෝ රටවල කැපවීම සහ ප්‍රජා උද්වේගය සලකා බැලීමේ දී, හරිත කටයුතු වල නිරත වී සිටින ව්‍යාපාර සහ තිරසාරාත්මක ව්‍යාපාර භාවිතයන් ප්‍රවර්ධනය කරන පාර්ශ්වයන්ට ද ඉහළ ගිය වෙළඳපොළ නියෝජනයක් භුක්ති විඳින අතරතුර, විවිධ රාජ්‍ය, පෞද්ගලික හා බහුජාතික නියෝජිත ආයතනවලින් මූල්‍ය සහාය ලබා ගත හැකිය.

සමස්තයක් ලෙස, මන්දගාමී වර්ධනය වැළැක්වීම සඳහා රටවලට ඉඩ ලබා දෙන, තිරසාර වර්ධනයට පහසුකම් සලසන ක්‍රියාමාර්ග මගින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයේ වර්ධනය සඳහා ද මග පැදෙයි. උදාහරණයක් ලෙස, නව දැනුම වර්ධනය කිරීම මත අවධාරණය තැබූ දැනුම පදනම් කර ගත් ආර්ථිකයක් බිහි කිරීමට උත්සාහ ගැනීම කොරියානු ආර්ථිකයේ සහ එහි ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ අංශයේ සාර්ථකත්වයේ ප්‍රධාන සාධකයක් බවට සැලකෙයි (Gregory et al., 2002). එමෙන්ම, ජර්මානු ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල සාර්ථකත්වයේ ප්‍රධාන සංරචකයක් ලෙස වාර්තා වී ඇති (Herr and Nettekoven, 2018) වෘත්තීමය පුහුණුව ඔස්සේ ව්‍යාපාරවලට අදාළ කුසලතා වැඩි දියුණු

2 ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අමාත්‍යාංශය, ඉන්දීය රජය.

2

කිරීම මත ඉලක්ක තබමින් අධ්‍යාපන පද්ධතියට සිදු කරන වැඩි දියුණු කිරීම් මගින් නූතන ගෝලීය වෙළඳපොළ තුළ තරග කිරීමට අවශ්‍ය කුසලතාවලින් හෙබි කුඩා ව්‍යාපාර බිහි කිරීමට දායක විය හැකිය.

### ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර[3]

ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ජනගහනයෙන් විශාල ප්‍රමාණයකට රැකියා ලබා දෙමින් ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාවලියේ විශාල කාර්යභාරයක් ඉටු කරයි. එසේ වුව ද, ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ද ඉහත සාකච්ඡා කළ ඔවුන්ගේ සංවර්ධනයට ඇති පොදු බාධාවන් බොහොමයකට මුහුණ දෙයි. රටේ නිෂ්පාදිතයෙන් සියයට 50ක් ඉක්ම වූ[4] දායකත්වයක් සහිතව ආර්ථික වැදගත්කමක් ලබා දුන්නද, හැකියාවන්හි සීමාසහිත බව (බෙහෝ විට මූල්‍ය සඳහා වන සීමිත ප්‍රවේශය සමඟ බැඳී ඇත), තාක්ෂණය භාවිතය අවම වීම සහ දේශීය සහ ගෝලීය දෙඅංශයේම අගය දාම සමඟ සීමිත සම්බන්ධතා හේතුවෙන් ශ්‍රී ලංකාවේ බොහෝ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ඔවුන්ගේ සැබෑ ධාරිතාවය වෙත ළඟා වී නොතිබිය හැකිය. මූල්‍ය සාක්ෂරතාවය අවම වීම සහ විවිධ හේතු මත විධිමත් මූල්‍ය පද්ධතිය වෙත ප්‍රවේශ වීමේ දුෂ්කරතා හේතුවෙන් ශ්‍රී ලංකාවේ බොහොමයක් කුඩා ව්‍යාපාරවලට රට පුරා ව්‍යාප්ත වී ඇති ඉතා ඉහළ ණය පොලී අනුපාත යටතේ මූල්‍ය සේවා සපයන ලියාපදිංචි නොකළ ණය සැපයුම්කරුවන්ගේ සේවා භාවිත කිරීමට සිදු වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, එවැනි බොහෝ ව්‍යවසායකයන් ඉහළ පොලී පිරිවැය ගෙවීමේ දුෂ්කරතාවලට මුහුණ දෙන අතර, එමගින් ඔවුන්ගේ ව්‍යාපාරයන්හි පැවැත්ම තර්ජනයට ලක් වේ. එවැනි ණය ලබා දීමේ සේවාවන්හි අවිධිමත් ස්වභාවය හේතුවෙන් එවැනි කටයුතු නිරීක්ෂණය කිරීම අපහසු වන අතර, එමගින් ඵලදායී නියාමන ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාව ද සීමා කරයි. මේ අතර, අනෙකුත් රටවල් මෙන් ශ්‍රී ලංකාවේ ද ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සම්බන්ධයෙන් අර්ථවත් තක්සේරුවක් කිරීම සඳහා තොරතුරු නොමැතිකම දැඩි සීමාවක් වී ඇති අතර, අවිධිමත් වෙළඳපොළ ණය ගනුදෙනුකරුවන්ගේ බලපෑම සහ ඔවුන්ගේ භූමිකාව පහසුකම් සැපයීම හෝ සූරාකෑමක් ද යන වග තක්සේරු කිරීම ද දුෂ්කර කරයි. රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන දෙඅංශයම විසින් විවිධ කාල වකවානුවලදී මෙම ව්‍යාපාර සඳහා සහය දැක්වීමට ප්‍රයත්න දරා ඇත. නිදසුනක් ලෙස, කර්මාන්ත සහ වාණිජ කටයුතු අමාත්‍යාංශයේ (2016) ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්ති රාමුවෙහි ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයෙහි සංවර්ධනය උදෙසා සවිස්තරාත්මක ක්‍රියාකාරී සැලසුම් අන්තර්ගත කර තිබේ. කෙසේ වෙතත්, එවැනි ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ සම්බන්ධීකරණය දුර්වල තත්ත්වයේ පවතින අතර, ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය තවදුරටත් වැඩි දියුණු කිරීම අවශ්‍ය වේ. ශ්‍රී ලංකා මහ බැංකුව ද තම නියෝජිත කාර්යයක් වන ප්‍රාදේශීය සංවර්ධනය යටතේ කුඩා ව්‍යාපාර සඳහා සහය වීමේ දී වැදගත් පහසුකම් සැපයීමේ භූමිකාවක් ඉටු කරයි. ඒ අනුව, සහභාගීත්ව මූල්‍ය ආයතන සහ අනෙකුත් සේවා සපයන්නන් බොහොමයක් සමඟ මූල්‍ය සහ මූල්‍ය නොවන සේවා සපයනු ලබයි. මේ අතර, වසංගත කාල සීමාව තුළ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වෙත ලබා දුන් විශාල ප්‍රතිපත්තිමය සහය තුළින් මෙම දුෂ්කර කාල සීමාව තුළ එම අංශයට අඛණ්ඩව ක්‍රියාත්මක වීමට උපකාරී විය. කෙසේ වෙතත්, පොදුවේ ගත් කල, ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර කොවිඩ්-19 වසංගතය විසින් නිර්මාණය කරන ලද නව සාමාන්‍ය අවස්ථාවන් මෙතෙක් ප්‍රයෝජනයට ගෙන නොමැත. තවද, ගෝලීය සහ දේශීය ආර්ථික කටයුතුවල දැනට පවතින අවනිශ්චිතතාවය ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා හානිකර විය හැකි අතර, ඒ සඳහා පිළියම් සහ වැළැක්වීමේ ප්‍රතිපත්ති අවශ්‍ය වේ. යෝජිත ණය ඇපකරණ ආයතනය කඩිනමින් ක්‍රියාත්මක කිරීම සහ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට අභියෝගාත්මක කාලයන් ජය ගනිමින් සමෘධිමත් වීමට අවශ්‍ය තිරසාර සහාය ලබා දීම සඳහා කැපවූ සංවර්ධන බැංකුවක් පිහිටුවීම ඇතුළු 'සක්‍රීය කරන්නන්' ක්‍රියාවට නැංවීම සඳහා ඉදිරියේදී කාලෝචිත ක්‍රියාමාර්ග අවශ්‍ය වේ. සමස්තයක් වශයෙන්, බොහෝ අවස්ථාවන්හි නොසලකා හරින ලද ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රමුඛ පෙළ ව්‍යාපාරික පරිසරයට ගෙන ඒම සඳහා ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ජාතික ප්‍රමුඛතාවයක් සහිතව සම්බන්ධීකරණය කළ යුතුය.

3 ශ්‍රී ලාංකික ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර විසින් මුහුණ දෙනු ලබන ගැටලු සහ අභියෝග පිළිබඳ සවිස්තරාත්මක සාකච්ඡාවක් මෙම වාර්තාවේ 1 වන පරිච්ඡේදයෙහි ගැටලු සහ ප්‍රතිපත්ති යන කොටසෙහි දැක්වේ.

4 කර්මාන්ත සහ වාණිජ කටයුතු අමාත්‍යාංශය, ශ්‍රී ලංකාව.

### මූලාශ්‍ර


1. Asian Productivity Organization (2015). Innovation and SME Financing in Selected Asian Economies.
2. Gonzales, E., Hommes, M. and Laura, M.M. (2014). MSME Country Indicators 2014: Analysis Note.
3. Gregory, G., Harvie, C., and Lee, H.H. (2002). 'Korean SMEs in the 21st Century: Strategies, Constraints, and Performance in a Global Economy', SMEs in a Global Economy Conference - Sustaining SME Innovation, Competitiveness and Development in the Global Economy, 272–290.
4. Herr, H. and Nettekoven, Z.M. (2018). The Role of Small and Medium-Sized Enterprises in Development: What Can be Learned from the German Experience?, Global Labour University Working Paper No. 53.
5. IFC (2014). Women-Owned SMEs: A Business Opportunity for Financial Institutions.
6. International Labour Organization (2016). Role of Finance in Driving Formalization of Informal Enterprises.
7. International Trade Centre (2014). SMEs Drive World Trade and Economic Growth.
8. Ministry of Industry and Commerce (2016). National Policy Framework for Small and Medium Enterprises (SMEs) Development: Action Plan.
9. OECD (2018). Improving the Business Environment for SMEs Through Effective Regulation, Policy Note, 2018 SME Ministerial Conference, OECD.
10. OECD/ERIA (2018). SME Policy Index: ASEAN 2018: Boosting Competitiveness and Inclusive Growth. SME Policy Index, OECD Publishing, Paris/ERIA, Jakarta.
11. United Nations (2021). Micro-, Small and Medium-Sized Enterprises Day, 27 June.
12. Wijesinha, A. (2011). SME Development Strategies for Sri Lanka: Learning Lessons from Neighbouring Countries, Talking Economics, Institute of Policy Studies of Sri Lanka.
13. Yoshino, N. and Taghizadeh-Hesary, F. (2016). Major Challenges Facing Small and Medium-Sized Enterprises in Asia and Solutions for Mitigating Them, ADBI Working Paper Series No. 564.